www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා යේමනය තුල ගුවන් ප්‍රහාර සඳහා නියෝග පනවයි

## Obama ordered US air strikes on Yemen

බැරී ග්‍රේ විසිනි.

2009 දෙසැම්බර් 21

**කා**න්තාවන්, ලමුන් ඇතුලු සිවිල් ජන කොටස් වලට මරු කැඳවමින් පසුගිය 17 දින යේමනයට එල්ල කල ඇමරිකානු ගුවන් ප්‍රහාර සඳහා එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමා පුද්ගලිකවම නියෝග නිකුත් කලේ ය.

සනා අගනුවර සිට කිමී 480 ක් වයඹ දෙසින් පිහිටි ඒබියන් ගම්මානයක් වන අල් මාජාලා හි හා සනාහි සිට කිමී 60 ඊසාන දෙසින් පිහිටි අර්හාබ් දිස්ත්‍රික්කයේ ද අල්කයිඩා කඳවුරු යයි නම්කල ස්ථාන වලට එක්සත් ජනපද යුද ගුවන්යානා වලින් ක්‍රෲස් මිසයිල ප්‍රහාර එල්ල කරන ලදී. පෙනී යන පරිදි එක්සත් ජනපද ප්‍රහාර, එහි පිටුබලය ලබන ඒකාධිපති යේමන් ජනාධිපති අලි අබ්ඩල්ලාහ් සලේ සමඟ සමීප සහයෝගයක් ඇතිව සිදුවිය. විරුද්ධ පක්ෂයේ ප්‍රකාශකයකුට අනුව බෝම්බ ප්‍රහාර එල්ලවූ නගර වලට මෙන්ම තවත් ගම්මානයකට ද යේමන් හමුදා අමතරව එල්ල කරනු ලැබූ ප්‍රහාර මගින් මිනිසුන් 120 ක් පමන මරනයට පත් විය.

එක්සත් ජනපදයේ ගුවන් ප්‍රහාර දැඩි ලෙස එල්ලවූ තැනක් වන මහ්සාඩ් හි ප්‍රාදේශීය නිලධාරීන්ට හා සාක්ෂිකරුවන්ට අනුව මිය ගිය සංඛ්‍යාව 60 කට වැඩි අතර බොහොමයක් සිවිල් වැසියන්ය. ඉලක්ක කරනු ලැබුවේ අල්කයිඩා බලකඳවුරක් ය යන්න ඔවුහු ප්‍රතික්ෂේප කලහ.

විමර්ශනාත්මක වාර්තාකරුවකු වන ඒබීසී මාධ්‍ය ජාලයේ බ්‍රයන් රොස් ප්‍රථමයෙන්ම 18 දින රාත්‍රියේ "ඒබීසී ලෝක ප්‍රවෘත්ති" වැඩසටහනේ දී වාර්තා කල පරිදි මෙම ප්‍රහාරයන් සඳහා එක්සත් ජනපද යුද ගුවන් යානා යොදාගෙන තිබුනි. "ඒබීසී ප්‍රවෘත්ති සේවයට ධවල මන්දිරයේ නිලධාරීන් ප්‍රකාශ කලේ, යේමනයේ පිහිටි සැකසහිත අල් කයිඩා මධ්‍යස්ථානවලට 17 දින එක්සත් ජනපද මිලිටරි ප්‍රහාර එල්ල කිරීම සඳහා නියෝග නිකුත් කරනු ලැබුවේ කෙලින්ම ඕවල් (ජනාධිපති) කාර්යාලයෙන්" බවයි. වැඩිදුරටත් ඔවුන් ප්‍රකාශ කලේ, "යේමනයේ ස්ථාන දෙකකදී එක්සත් ජනපද මිලිටරිය විසින් ක්‍රෲස් මිසයිල ප්‍රහාර එල්ල කර ඇත" යනුවෙනි.

අල් ජසීරා මගින් අද දින ප්‍රචාරය කල ඡායාරූප මගින් ඇතිරිලි වලින් ආවරනය කල දුසිම් ගනනක් මල සිරුරු පෙන්නුම් කලේ ය. නිලධාරීන් කියා සිටියේ සැකකාර අල්කයිඩා සටන් කරුවන් 35 ක් මරාදමන ලද බවයි. විරුද්ධ පක්ෂ කන්ඩායම් කියා සිටියේ තවත් දුසිම් ගනනනක් සාමාන්‍ය සිවිල් වැසියන් ද මරා දමන ලද බවයි. ධවල මන්දිර නිලධාරීන් පවසන ලදැයි ඒබීසී ප්‍රවෘත්ති සේවය වාර්තා කලේ, ප්‍රහාර වලින් පසු ඔබාමා යේමන ජනාධිපති සලේ අමතා ප්‍රහාර සම්බන්ධයෙන් 'ප්‍රශංසා' කල බවයි. 18 දින එක්සත් ජනපද නිලධාරින්, ඒබීසි ප්‍රවෘත්ති වාර්තාව සම්බන්ධව කිසිවක් පැවසීම ප්‍රතික්ෂේප කල නමුත් එය සාවද්‍ය බවක් ද ඔවුන් ප්‍රකාශ නොකලේ ය. "මේ අවස්ථාවේ වැඩිදුර විස්තර දැක්වීමට අපි සූදානම් නැත" යනුවෙන් එක් නිලධාරියෙක් පැවසී ය. ඔහු තවදුරටත් කීවේ යේමනය සහ එක්සත් ජනපදය ත්‍රස්ත්‍රවාදයට එරෙහිව සහයෝගයෙන් කටයුතු කරන බවයි. ප්‍රහාර සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ භූමිකාව වාර්තා කල 19 දින *නිව්යෝක් ටයිම්ස්* පත්‍රයට පෙන්ටගන් ප්‍රකාශකයෙක් වන බ්‍රයන් වයිට්මාන් ප්‍රකාශ කලේ " අල්කයිඩාවට එරෙහිව ගත් ක්‍රියාමාර්ග පිලිබඳව යේමනයට ප්‍රශංසා කල යුතු ය." යනුවෙනි.

මෙම මිලේච්ඡ මිලිටරි ප්‍රහාර හෙලා දැකීම පිනිස දහස් සංඛ්‍යාත පිරිස් 19 දින දකුනු දිග යේමනයේ වීදිවලට පැමිනියහ. ස්වදේශික මූලාශ්‍ර අනුව, ආන්ඩුවට එරෙහි සටන් පාඨ කියමින් සහ ප්‍රහාර සම්බන්ධ පරීක්ෂනයක් පවත්වන ලෙස ඉල්ලා සිටිමින් දාලේ පලාතේ 3,000 පමනත්, ලාජ් සහ අබියන් පලාත්වල සිය ගනනිනුත් ජනතාව එසේ විරෝධය පලකලහ.

සනා සිට දකුනු දෙසට කි.මී 260 ක් දුරින් පිහිටි මායිස් පලාතේ 10,000 ක පමන ජනතාවකගේ සහභාගීත්වයෙන් පැවැත්වුනු රැලියකදී පක්ෂ සයකින් සැඳුම්ලත් විරුද්ධ පක්ෂ සන්ධානයක් වන එක්සත් සමුලු පක්ෂය සිවිල් වැසියන් ඉලක්ක කර

ගැනීම හෙලා දුටුවේ ය. සන්ධානයේ ප්‍රධාන සමාජිකයෙක් මෙම ප්‍රහාර හැඳින්වූයේ 'සාහසික අපරාධයක්' ලෙසයි.

උතුරෙන් වෙන්ව පාලනයක් පිහිටුවා ගැනීමට උත්සාහ කරන දක්ෂින ව්‍යාපාරය දක්වා සිටියේ මෙකී ප්‍රහාර එල්ල කරනු ලැබූවේ දකුනේ ජනතාව මත මිස අල්කයිඩාවට එරෙහිව නොවන බවයි. "මෙය ජන සංහාරයකි" යනුවෙන් දක්ෂින ව්‍යාපාරයේ ප්‍රධාන දේශපාලනඥයෙක් වන අබ්බාස් අල් අසාල් ප්‍රකාශ කලේ ය. ඒබියන් හීදී ගුවනින් සහ ගොඩබිමින් එල්ල කල ප්‍රහාර වලින් ලමුන් 23 ක් ද ගැහැනුන් 17 ක් ද ඇතුලත් සාමාන්‍ය වැසියන් 64 ක් මරා දැමුනි. 18දා පල කල එක්සත් ප්‍රවෘත්ති සමාගමේ වාර්තාවකට අනුව, එහි කිසිදු අල්කයිඩා පුහුනු කඳවුරක් නොතිබුනු බවත්, මෙම ප්‍රබල ප්‍රහාරය මගින් ගෝත්‍රික ගම්බද ප්‍රදේශයක් වන මෙහි, කටුමැටි නිවාස හා පැල්පත් සමූහයක් විනාශකර දමා ඇති බවත් ඒබියන් වාසීන් ප්‍රකාශ කර තිබුනි. එහි ජීවත් වන අලි මොහොමඩ් මන්සෝරී ප්‍රකාශකලේ, මියගියවුන් වැලලීමට ඔහු උදව් කල බවයි. අදාල ප්‍රදේශය පුහුනු කඳවුරක්ය යන්න ප්‍රතික්ෂේප කල ඔහු පෙන්වා දුන්නේ, ජන කොටස ජීවත් වූ ප්‍රදේශය ප්‍රධාන මාර්ගයට මීටර් 100 ක් ද හමුදා කඳවුරකට කි.මී 2 ක් ද පමනක් ඇතින් පිහිටා තිබුනු බවයි. මන්සෝරී ප්‍රකාශ කලේ මියගිය අයගෙන් කෙනෙකු වන සවුදි ජාතික මොහොමඩ් සලේ අල් කසෙම්, යේමනයට පැමිනීමට පෙර ඇෆ්ගනිස්ථානයේ සටන්වලට සහභාගීවීම නිසා දෙවසරකට සිරගත කරනු ලැබ 2005 දී නිදහස් වී ඇති බවත් පසුව තම පවුල සමග ගම්මානයේ ජීවත්ව සිට ඇති මුත් සැඟවී සිට නැති බවත් ය.

17දා සිදුකල ප්‍රහාර, යේමනය තුල සිදුකරමින් පවතින එක්සත් ජනපද මිලිටරි ප්‍රහාරයන්ගේ වර්ධනීය අවස්ථාවක කොටසකි. ඒවා, එක්සත් ජනපද රූකඩයෙක් වන ජනාධිපති සෙලාගේ පාලන තන්ත්‍රයේ ද ඊජිප්තුවේ සහායලත් සව්දි රජපවුලේ ද සහයෝගය අතිව සිදුවිය. 17 තෙක් යේමනයේ උතුරු ප්‍රදේශයේ විශාල පරිමාන එක්සත් ජනපද මිලිටරි ප්‍රචන්ඩත්වයක් ක්‍රියාත්මකව පැවති අතර ඉරානයේ ෂියා මුස්ලිම් වරුන්ට සම්බන්ධකම් ඇති හූට් ගෝත්‍රයේ සටන්කාමීන් විසින් ගෙනයන කැරැල්ලට එරෙහිව ඒවා දියත් කෙරිනි.

පසුගිය සතියේ සව්දි අරාබියේ දේශ සීමාවට යාබදව පිහිටි වයඹදිග සාධා පලාතට එක්සත් ජනපද ප්‍රහාරක ගුවන් යානා විසින් ප්‍රහාර 28 ක් දියත් කරනු ලැබූ බව හූට් සටන්කාමීහු ප්‍රකාශ කලහ. අගෝස්තු මාසයේ සිට ජනාධිපති සලේ විසින් හූට් ප්‍රතිරෝධය අතුගා දැමීම සඳහා 'දැවුනු මිහිකත මෙහෙයුම' ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව මේ දක්වා ආන්ඩුව, සව්දි හමුදා සහ ප්‍රහාරක ගුවන් යානා යොදා ගනිමින් දකුනු දිග සව්දි අරාබිය දක්වා, යේමනය තුල විශාල භූමි ප්‍රදේශයක් තුලට පහර දෙමින් සිටියි. සලේ, රියාඩ් සහ කයිරෝව සපථකර සිටින්නේ ඉරානය හූට් සටන්කාමීනට ආධාර උපකාර කරන බවයි. එහෙත් ඉරානය එම චෝදනා ප්‍රතික්ෂේප කරයි.

අල්කයිඩා සංවිධානය සුන්නි ව්‍යාපාරයක් වන අතරම එය හූට් වැනි ෂියාවරුන්ට දැඩි ලෙස විරුද්ධ කොටසක් වන නමුත් ඔබාමා පරිපාලනය, යේමනයේ විවිධ ප්‍රතිරෝධී ව්‍යාපාර අල්කයිඩා සංවිධානයට සම්බන්ධ කොට දක්වයි. දෙසැම්බර් 13 දින බ්‍රිතාන්‍යයේ *ඩේලි ටෙලි ග්‍රාෆ්* පුවත්පත නිර්නාමික ඇමරිකානු නිලධාරීන්ගේ ප්‍රකාශන වාර්තා කරමින් දන්වා සිටියේ යේමනයේ හමුදාව පුහුනු කිරීම සඳහා එක්සත් ජනපදය විශේෂ බලකායේ භටයින් පිටත් කොට හැරි බවයි. එක්සත් ජනපද මිලිටරි නිලධාරියෙක් ප්‍රකාශ කලේ යයි පුවත් පත උපුටා දැක් වූයේ "ඇෆ්ගනිස්තානය හා පාකිස්ථානය තුල අල්කයිඩා ක්‍රියාකාරකම් වල පදනම් කලාපයක් ලෙස යේමනය පත් වෙමින් තිබේ" යනුවෙනි.

මෙය, වොෂින්ටනය ඇෆ්ගනිස්ථානය හා පාකිස්තානය තුල කරගෙන යනු ලබන යුද්ධය යේමනය දක්වා ව්‍යාප්ත කරමින් තිබෙන බවට පැහැදිලි සංඥාවකි. වාර්තා වන පරිදි, සවුදි ප්‍රහාරක ජෙට් යානා හූට් සටන් කාමීන්ට එරෙහිව පොස්ෆරස් බෝම්බ යොදා ගෙන තිබේ. දෙසැම්බර් 13 දින හූට් මූලාශ්‍ර සඳහන් කලේ උතුරු රාසේ දිස්ත්‍රික්කයේ 70 පමන මරනයට පත් කරමින් සහ 100 කට පමන තුවාල සිදු කරමින් සවුදි හමුදාව දේශ සීමා හරහා විශාල ප්‍රහාරයක් දියත් කල බවයි. එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කවුන්සිලය ගනන් බලා ඇති ආකාරයට සඩා ප්‍රදේශයේ 175,000ක ජනතාවකට තම නිවෙස් අත හැර පලා ගොස් ජලය හෝ ආහාර ප්‍රමානවත් ලෙස නොලැබෙන සරනාගතයන්ගෙන් පිරී ගිය අනාථ කඳවුරු වල පිහිට පැතීමට බල කෙරී ඇත. කඳවුරුවල අසතුටුදායක තත්ත්වය හේතුවෙන් දරුවන් මිය ගොස් ඇත.

පසුගිය 17දා යේමනයේ මෙම එක්සත් ජනපද ප්‍රහාරයන් සිදුවූයේ ද, ගම්මානයක් විනාශ කරමින් අවම වශයෙන් පුද්ගලයින් 17ක් මරා දැමූ පාකිස්තානයේ උතුරු වසිරිස්තාන් වෙත වොෂින්ටනය ප්‍රබල ප්‍රහාරයක් දියත් කලේ ද එකම දිනයක ය.

ඔබාමා ඇෆ්ගනිස්තානයට යැවීමට නියෝග කර ඇති 30,000 ක හමුදාවේ පලමු සේනාංක වල සම්ප්‍රාප්තියත් සමඟ සම්පාතව සිදුවූ මෙකී වර්ධනයන් පෙන්නුම් කරන්නේ, බුෂ් පාලන තන්ත්‍රයේ ක්‍රියා පිලිවෙත ද අබිබවමින් ඔබාමා පාලන තන්ත්‍රය මිලිටරි ප්‍රහාරයන් සහ විජිතකරනයේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරමින් සිටින බවයි. ඇෆ්ගනිස්තානය තුල යුද්ධය තව දුරටත් උත්සන්න කිරීම පිලිබඳව ඔබාමා දෙසැම්බර් 1 වන දින වෙස්ට් පොයින්ට් හිදී කල කතාවේ දී ඇඟවුම් කල පරිදි හා වඩාත් සෘජු ලෙස දෙසැම්බර් 10 දින

නොබෙල් ත්‍යාගය පිලිගැනීමේ කතාවේ දී දැක්වූ පරිදි, මෙකී ක්‍රියාමාර්ගයන් පෙන්නුම් කරන්නේ, මනුෂ්‍ය ඝාතනය හා විනාශය පිලිබඳ ඇඟවීමයි. වෙස්ට්පොයින්ට්හි දී කල කථාවේ දී ඔබාමා "දරුනු අන්තවාදයට එරෙහි අරගලය ඉක්මනින්ම අවසන් නොවනු ඇත" යනුවෙන් ප්‍රකාශ කරමින් තවදුරටත් කීවේ එය "ඇෆ්ගනිස්ථානය සහ පකිස්ථානයට වඩා බොහෝ ඈතට විහිදෙනු ඇත" යනුවෙනි. "පිලිවෙලකට නැති කලාප සහ පැතිරිගිය සතුරන්" පිලිබඳ කථාකල ඔහු සෝමාලියාව හා යේමනය නම් වශයෙන්ම සඳහන් කලේ ය. ඔහුගේ නොබෙල් ත්‍යාග කථාව වූකලී අධිරාජ්‍යවාදී යුද්ධය හා නව යටත්විජිතවාදය පිලිබඳ යුදවාදී සංක්ෂිප්තයකි. මතු ආරක්ෂාව සඳහා යුද්ධ (පූර්වභංග යුද පිලිවෙත) කිරීමේ සදාචාරය ගෙනහැර දැක්වූ ඔබාමා ඉරානය, සුඩානය, කොංගෝව, සිම්බාබ්වේ සහ මියන්මාර් ඇතුලු එක්සත් ජනපදයේ මිලිටරි ප්‍රචණ්ඩත්වයේ අන්තරායට මුහුනපා සිටින ඉලක්ක මාලාවක් ගැන සඳහන් කලේ ය.

ඉරාකය ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මැදිහත්වීම් මෙන්ම යේමනය තුල එහි ප්‍රචණ්ඩ පිලිවෙත ද අල්කයිඩාව පරාජය කිරීම හෝ ඇමරිකානු ජනතාව ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීම සමඟ මෙලොව සම්බන්ධයක් ඇත්තේ නැත.

මධ්‍යම ආසියාවේ සහ මැදපෙරදිග ඛනිජ තෙලින් පොහොසත් කලාපවල තම ආධිපත්‍යය පතුරාලීමේත්, මූලෝපායික වශයෙන් තීරනාත්මක තෙල් නල පද්ධතීන් සහ නාවික මාර්ග කෙරෙහි එක්සත් ජනපද පාලනය පිහිටුවා ගැනීම පිනිසත් ඇමරිකානු පාලක පන්තියේ අභිලාෂය මෙම ක්‍රියාකලාපය උසිගන්වන පෙලඹවීම වී තිබේ. සීතල යුද සමයේ එක්සත් ජනපදය හා සෝවියට් සංගමය අතර පොර පිටියක් බවට පත්වුනු යේමනය වැදගත් භූගෝලීය පිහිටීමක් සහිත රටකි.

පසුගිය 17දා සිදුකල ගුවන් ප්‍රහාර පිලිබඳ වාර්තාවක එක්සත් ප්‍රවෘත්ති සේවය සඳහන් කල පරිදි, "යේමනය පිහිටා ඇත්තේ සූවස් ඇලට පිවිසුම් දොරටුව වන රතු මුහුද හා ඒඩ්න් බොක්කේ මූලෝපායික වශයෙන් වැදගත් නාවික සන්ධිස්ථානයක ය. එසේම බොක්ක හරහා පිහිටා ඇත්තේ ඊටත් වඩා අර්බුදවලින් ගහන රාජ්‍යයක් වන සෝමාලියාවයි." එක්සත් ජනපදය දැනටමත් සෝමාලියාවට එරෙහිව මිලිටරි ප්‍රහාර දියත් කර ඇති අතර ඉතියෝපියාව තුල රැඳී සිටිමින් යුද්ධය සඳහා එරට බලල් අතක් ලෙස යොදාගෙන තිබේ.

යේමනය මත ඇමරිකානු මිලිටරි හා දේශපාලන පාලනය පිහිටුවා ගැනීම අරමුනු කරගෙන එක්සත් ජනපදය විසින් විශේෂයෙන් එක් පැත්තකින් සවිදි අරාබිය හා ඊජිප්තුව අතරත් සවිදි අරාබිය හා ඉරානය අතරත් යනාදි වශයෙන් කලාපය පුරා ආතතිය අවුලුවාලමින් සිටී.

විවෘත හා ආවෘත ආකාරයෙන් ඒඩ්න් බොක්ක කලාපය වටා කෙරෙන එක්සත් ජනපද මිලිටරි ඇගිලිගැසීම්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ගෝලීය සැලසුම් වල ඉලක්ක බවට පත්ව ඇති ජනතාවන් මෙන්ම ඇමරිකානු ජනතාව කෙරෙහි ද ව්‍යසනකාරී ඇඟවුම් පිලිබඳ අනතුරු හැඟවීම් ලෙස වටහා ගත යුතු ය. වොෂින්ටනයේ නව යටත් විජිතවාදී මූලෝපායයන්ට තිත තැබිය හැක්කේ ඇමරිකානු හා ජාත්‍යන්තර වැඩකරන පන්තියට පමනි.

මෙය ඔබාමා පරිපාලනයට එරෙහි ඍජු අරගලයක් ඉල්ලා සිටී. 'වෙනසක්' සහ 'බලාපොරොත්තුවේ' අපේක්ෂකයා ලෙස පත්වීමෙන් වසරකට මදක් වැඩි කාලයකට පසු ඔබාමා යුද අපරාධකරුවකු ලෙස ද වෝල් වීදියේ හා එක්සත් ජනපද මිලිටරි-බුද්ධි අංශ සැකැස්මේ උපකරනයක් ලෙස ද පෙනී සිටී. මිලිටරිවාදයට එරෙහිව සටන් කිරීම සඳහා වැඩකරන පන්තිය ඔබාමා, ඩිමොක්‍රටික් පක්ෂය, ද්විපක්ෂ ක්‍රමය මෙන්ම මර්දනය සහ යුද්ධයට එරෙහි ස්වාධීන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැඟිය යුතු ය.

© www.wsws.org